ඛනිජ තෙල් ලබාගැනීම කර්මාන්තයක් වශයෙන් ආරම්භ වූයේ 1859 දී පමණ යැයි සැලකේ. එඩ්වින් ඩ්රේක් විසින් පෙන්සිල්වේනියාවේ පලමු තෙල් ලිද කැනීම් ආරම්භ කිරීම මහා පරිමාණ වානිජ තෙල් කර්මාන්තයේ ආරම්භය ලෙස සැලකේ. මෙහිදී ලබාගත් පෙට්රෝලියම් වල ප්රධාන භාවිතයක් ලෙස භූමිතෙල් ආලෝක පහන් සදහා ද ඉවුම් පිහුම් සදහා ඉන්ධන ලෙසද යොදා ගැනීම සිදුවිය. එය එකල ඉවුම් පිහුම් සදහා යොදාගත් තල්මස් තෙල් සදහා ආදේශකයක් වූ  නිසා තෙල්  කර්මාන්තයේ වර්ධනය තල්මසුන් බේරාගැනීම සදහා  උපකාරී වූ බවටද මතයක් එකල ගොඩ නැගී ඇත.

ඛනිජ තෙල් කර්මාන්තය සීග්රයෙන් ජනප්රිය වූ අතර  තෙල් ලිං කැනීමට ඉඩම් අත්පත්කර ගැනීම ආදී කටයුතු වලදී ගැටලු මතුවූ නිසා නව නීති ද සම්පාදනය විය.1880 පමණ වන විට ස්ටැන්ඩඩ් ඔයිල් සමාගම ඇමෙර්රිකා එක්සත් ජනපදය තුල තෙල් ඒකාධිකාරයක් ගොඩනගාගෙන සිටි අතර  මෙම ඒකාධිකාරය 1911දී නඩු තීන්දුවක් මගින් බිදවැටුනි. 1908දී හෙන්රි ෆෝඩ් මහා පරිමාණයෙන් Model T නම් මෝටර් රථය නිර්මාණය කිරීම නිසා තෙල් පරිභෝජනයේ විශාල වැඩි වීමක් සිදුවිය.

1912 වසරේදී බ්රිතාන්ය නාවික හමුදාව ගල් අගුරු වෙනුවට ඛනිජ තෙල් භාවිතයට යොමුවීම වැදගත් සිදුවීමක් බවට පත්විය. පලමු ලෝක යුද්ධයේදී ඛනිජ තෙල් බලයෙන් ක්රියාත්මක වූ බ්රිතාන්ය නාවික හමුදා ගල් අගුරු භාවිතා කල ජර්මානු නාවික හමුදා අභිබවා යැමද සිදුවිය.

මෙම කාලවකවානුව තුල  ඛනිජතෙල් පලමු වරට උපායමාර්ගික වෙලද භාණ්ඩයක් බවට පත්විය. ඒත් සමගම මැද පෙරදිග කලාපය කෙරෙහි බටහිර රටවල වැඩි අවධානයක් යොමුවූ අතර බ්‍රිතාන්‍ය ,ප්‍රංශ,ඇමෙරිකා එක්සත් ජනපද තෙල් සමාගම් අතර තෙල් සංචිත සම්බන්ධයෙන් තරගයක් නිර්මාණය වීමද සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස 1928  දී  රතු රේඛාව යටතේ ගිවිසුම( Red Line Agreement ) අත්සන් තැබීම සිදුවිය. ඔටෝමාන් අධිරාජ්‍යයට අයත් වූ භූමි ප්‍රදේශය තුල තෙල් බෙදාගැනීමට ඇමරිකානු සහ යුරෝපා තෙල් සමාගම් අතර මෙම ගිවිසුම ඇතිවිය.




Image- https://www.geoexpro.com/

දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව යටත් විජිත බිදවැටීම ඇරඹුනු අතර තෙල් අපනයනය කරන රටවල් ද වාසිදායක ගනුදෙනු පිලිබද සාකච්ඡා අරඹන ලදි. 1948දී වෙනිසියුලාව විසින් 50/50 ලාභ බෙදාගැනීමට නීතියක් සම්මත කල අතර එය මැද පෙරදිග කරාද ව්‍යාප්ත විය. ජාතිකවාදී අදහස් ද මෙම කාලය තුල ව්‍යාප්ත වූ අතර  1956 දී ඊජිප්තු ජනපති ගේමෙල් අබ්දුල් සූවස් ඇල ජනසතු කරන ලදි. එමගින් තෙල් ප්‍රවාහනයට බාධා ඇතිවූ අතර බ්‍රිතාන්‍ය ,ප්‍රංශ, ඊශ්‍රායල් හමුදා ඒකාබද්ධව ඊජිප්තුව ආක්‍රමණය කිරීමට තරම් තෙල් ගැටලුව උග්‍රවිය.එම සිදුවීමෙන් පසු බ්‍රිතාන්‍ය ලෝක බලවතෙක් ලෙස ලබාගෙන සිටි බලය පිරිහීමකට ලක්වූ අතර ඊජිප්තුවට සූවස් ඇලෙහි හිමිකාරිත්වය ලැබුණි.

1960  දී  ඉරානය,ඉරාකය,කුවෙට්,සෞදි අරාබිය සහ වෙනිසියුලාව එක්ව OPEC සංවිධානය නිර්මාණය කිරීම තෙල් සම්බන්ධයෙන් නව ප්‍රතිපත්ති බිහිවීමට හේතුවක් විය. 1965 දී තෙල් ඉල්ලුම ගල් අගුරු අභිබවා යාමද සිදුවිය. 1973 වන විට OPEC සාමාජිකයන් 12 දෙනකුගෙන් යුක්ත වූ අතර  ලෝක තෙල් නිශ්පාදනයෙන් 53.9% ක ප්‍රතිශතයක් ඔවුන් සතුවිය.

අරාබි ඊශ්‍රායල් යුද්ධය,ඉරාන විප්ලවය,ගල්ෆ් යුද්ධය වැනි ගැටුම් ද තෙල් මිලෙහි වෙනස්කම් සදහා වරින්වර බලපෑම් කල අතර වර්තමනයේ ඇතිවී ඇති යුක්රේන් රුසියන් යුද්ධය ද මේ වන විට තෙල් මිල සම්බන්ධයෙන් විවිධ බලපෑම් එල්ල කරයි.




source- energy.gov